(අටවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1(5).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2020 පෙබරවාරි 20 වැනි බ්‍රහස්පතින්දා**

---

## 2020 මාර්තු 03 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග (අංක 1),— 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 ඔක්තෝබර් 31 දිනැති අංක 2147/72 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග (අංක 2),— 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 දෙසැම්බර් 14 දිනැති අංක 2153/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),—සුරාබදු ආඥා පනතේ (52 අධිකාරය) 4, 13 සහ 17 වගන්ති යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 සැප්තැම්බර් 27 දිනැති අංක 2142/77 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.18 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

( අංක 05/2019 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා,— සුරාබද්දු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),—සුරාබද්දු ආඥා පනතේ (52 අධිකාරය) 22 වගන්තිය යටතේ සුරාබද්දු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 2152/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.18 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

( අංක 07/2019 දරන සුරාබද්දු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා,— සුරාබද්දු ආඥාපනත යටතේ නිවේදනය (අංක 3),— සුරාබද්දු ආඥා පනතේ (52 අධිකාරය) 12, 14 සහ 22 වගන්ති සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ සුරාබද්දු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 2152/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.18 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

( අංක 08/2019 දරන සුරාබද්දු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා,— සුරාබද්දු ආඥාපනත යටතේ නිවේදනය (අංක 4),— සුරාබද්දු ආඥා පනතේ (52 අධිකාරය) 22 වගන්තිය යටතේ සුරාබද්දු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 2152/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.18 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

( අංක 09/2019 දරන සුරාබද්දු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යතුමිය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 අධිකාරය) වෛද්‍ය ආඥාපනතේ 72 වගන්තිය සමඟ කියවිය යුතු 19(ඉ) වගන්තිය යටතේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 26 දිනැති අංක 2055/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සහ එම නියෝග සංශෝධනය කරමින් සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 26 දිනැති අංක 2155/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.19 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2020 මාර්තු 17 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

20/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 ජූලි 07 වැනි දින මඩකලපුවේදී පැවති ජාත්‍යන්තර සමූපකාර දින සැමරුම සඳහා ආහාර සැපයීමේ ඇනවුම ලබා දුන් ආයතනය හෝ පුද්ගලයා කවුරුන්ද;

(ii) ඒ සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) උක්ත උත්සවයට ආහාර සැපයීම වෙනුවෙන් ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iv) එසේ නම්, ඒ සඳහා ඉදිරිපත් වූ ටෙන්ඩර් සංඛ්‍යාව කොපමණද;

(v) එම ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතන/පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත ආහාර සැපයීම සිදු කළ රියාස් නමැති පුද්ගලයා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු බවත්;

(ii) නිසි ක්‍රමවේදයන්ගෙන් තොරව ඔහු මෙම අධ්‍යක්ෂ තනතුරට පත්කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

61/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යහපාලන රජය කාලය තුළදී මුහුණ දුන් ස්වභාවික ආපදාවන් සහ එම ආපදාවලදී මියගිය හා අතුරුදහන් වූ පුද්ගලයන් සංඛ්‍යාව සහ සිදු වූ දේපළ හානි කවරේද;

(ii) එම එක් එක් අවස්ථාවේදී පීඩාවට පත් වූ ජනතාව වෙනුවෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ලබාදුන් සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

87/2020

ගරු හේෂා විතානගේ මහතා,— උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි බාහිර උපාධි පාඨමාලා හැදෑරීම සඳහා තිබූ අවස්ථාව අඩු කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(ii) වර්ෂ 2010 සිට 2017 දක්වා බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගැනීමට අනුමත කළ ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (ii) හි සඳහන් ශිෂ්‍යයන් හදාරන උපාධි පාඨමාලා කවරේද;

(iv) බාහිර උපාධිධාරීන් බිහිකරලීම තවදුරටත් වැඩිකිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

98/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ පිවිසුම් මාර්ගය ඉදිකිරීමේදී හානියට පත්වන දේපළ හා අත්කර ගනු ලබන ඉඩම්වලට වන්දි ගෙවීමක් සිදුකරන්නේද;

(ii) එසේ නම්, වන්දිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා තක්සේරු කර ඇති වන්දි ප්‍රමාණය කොපමණද;

(iv) මේ වනවිට මේ සම්බන්ධයෙන් යම් ගෙවීමක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා තිබේද;

(v) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(vi) එම ගෙවීම සිදු කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

125/2020

ගරු බිමල් රත්නායක මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට වර්ෂ කිහිපයකට පෙර පොලිස් නිලධාරින්ට රු.150,000/-ක සහන මිලකට යතුරුපැදි ලබා දුන් බවත්;

(ii) එම යතුරුපැදි ලබා දීමේදී කිසිදු කොන්දේසියකට යටත් නොකළ බවත්;

(iii) එසේ වුවද, යතුරුපැදි ලබා ගත් විශ්‍රාමික පොලිස් නිලධාරින් සියලු දෙනාටම රු.150,000/- ත් රු. 200,000/- අතර මුදලක් ගෙවන ලෙස බල කර ඇති බවත්;

(iv) එම මුදල ගෙවන තෙක් විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ නොකරන බව ඔවුන්ගේ සේවා ස්ථානවලින් දන්වා ඇති බවත්;

(v) මේ අනුව, විශ්‍රාමික පොලිස් නිලධාරින් විශාල පිරිසක් දීර්ඝ කාලයක සිට විශ්‍රාම වැටුප් නොලැබීම හේතුවෙන් අසරණවී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිසට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස නොපමාව සුදුසු ක්‍රමවේදයක් සකසන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

131/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණු කවරේද;

(ii) එහි කාර්යභාරයන් කවරේද;

(iii) පාරිභෝගික කටයුතුවලට අදාළව සිදු කරනු ලබන කුමන වැරදි සම්බන්ධයෙන් එම අධිකාරියට ක්‍රියා කළ හැකි වන්නේද;

(iv) අධිකාරියේ බලතල හා වැරදිකරුවන්ට එරෙහිව ගතහැකි ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2017 වර්ෂය තුළ එම අධිකාරිය විසින් සිදුකර ඇති,

(i) වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) සිදුකර ඇති දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව සහ ඒවා පැවැත්වූ ස්ථාන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දුර ගමන් සේවා මගී ප්‍රවාහන බස් රථ නවත්වනු ලබන බොහෝ ආපනශාලාවල වැඩි මිලට ආහාරපාන අලෙවි කරමින් ගුණාත්මක භාවයෙන් අඩු ආහාරපාන අලෙවියේ නිරත වන බවත්, පාරිභෝගික වරණය සීමා වීම තුළ පාරිභෝගිකයන් මහත් අපහසුතාවයන්ට ලක් වන බවත් පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

134/2020

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 සැප්තැම්බර් 30 දිනට ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එකී එක් එක් තනතුරු පුරප්පාඩු වූ දිනය කවරේද;

(iii) එකී තනතුරු පිරවීම සඳහා මේ වනතෙක් පියවර නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

137/2020

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ පිටත අධිවේගී මාර්ගය සහ මධ්‍යම අධිවේගී මාර්ගය යන අධිවේගී මාර්ග දෙකෙහි එක් එක් අදියර,

(i) ආරම්භ කළ දිනය හා අවසන් කිරීමට නියමිත දිනය;

(ii) දුර ප්‍රමාණය;

(iii) ශක්‍යතා අධ්‍යයන සිදු කළ සමාගම් හා සිදුකරන ලද වර්ෂය;

(iv) මුල් ඇස්තමේන්තුගත වියදම හා ඇස්තමේන්තුගත කළ වර්ෂය;

(v) ලබාගත් ණය ප්‍රමාණය, පොළිය හා ආපසු ගෙවිය යුතු කාල සීමාව;

(vi) එම ණය ලබාගත් ආයතන;

(vii) ඉදිකිරීම් කොන්ත්‍රාත් සිදු කළ හෝ සිදු කරමින් පවතින සමාගම;

(viii) ඉදිකිරීමට වැය වූ හෝ වැය වෙතැයි අපේක්ෂිත මුළු මුදල;

(ix) කිලෝමීටරයක් සඳහා වැය වූ හෝ වැය වෙතැයි අපේක්ෂිත මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

21/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂය තුළ නීති විරෝධීව මෙරටට ආනයනය කළ වාහන අමතර කොටස් ශ්‍රී ලංකා රේගුව මඟින් අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) එසේ නම්, අත්අඩංගුවට ගත් වාහන අමතර කොටස්වල වටිනාකම කොපමණද;

(iii) උක්ත වාහන අමතර කොටස් ගෙන්වූ රටවල් කවරේද;

(iv) එම නීති විරෝධී ආනයන සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) එසේ නම්, එම නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වාහන අමතර කොටස් නිෂ්පාදනය කර්මාන්තයක් ලෙස මෙරට ව්‍යාප්ත කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

62/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යහපාලන රජය පාලනයට පත්වීමෙන් අනතුරුව, කාලගුණය පිළිබඳ හැදෑරීමට විදේශගත වූ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් විදේශගත වූ රටවල් හා අදාළ පාඨමාලාවේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සංචාර සඳහා වැය කළ මුදල කොපමණද;

(iv) එම සංචාරවලින් රටට අත්වූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

88/2020

ගරු හේෂා විතානගේ මහතා,— ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1996 ක්‍රිකට් ලෝක කුසලානය ජයග්‍රහණය කරන අවස්ථාවේදී ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපතිවරයා කවුරුන්ද;

(ii) එතැන් සිට මේ දක්වා පාලක මණ්ඩලයට පත් වූ සභාපතිවරුන් හා ඔවුන්ගේ පාලන කාලසීමාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාලන කාලසීමාවන් තුළ ශ්‍රී ලංකා කණ්ඩායම සහභාගි වූ ටෙස්ට්, එක්දින පන්දු වාර 50 හා පන්දු වාර 20 තරඟ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම තරඟවල ජය පරාජය සහ ප්‍රතිඵලයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව ලෝක ක්‍රිකට් කුසලානය ජයග්‍රහණය කළ රටක් වුවද, පරිපාලන දෝෂ හේතුවෙන් මේ වනවිට ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව දැඩි කඩා වැටීමකට ලක් වී ඇති බව පිළිගන්නේද;

(ii) නැවත ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීමට සහ ජයග්‍රහණ අත්කර ගැනීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

99/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ මුල් අදියර සඳහා ජලය ලබා ගැනීමට වැය වන මුදල කොපමණද;

(ii) එම කොන්ත්‍රාත්තුව ලබා දුන් දිනය කවරේද;

(iii) ඒ සඳහා වූ කාලය කොපමණද;

(iv) එහි ඉදිකිරීම් මේ වනවිට ආරම්භ කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

126/2020

ගරු බිමල් රත්නායක මහතා,— නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පේෂකර්ම සංස්ථාවට අයත්ව පැවති තුල්හිරිය පෙහෙකම්හල මුලින්ම බොම්බෙ ටෙක්ස් ආයතනයට විකුණූ බවත්;

(ii) පසුව එම සමාගම විසින් එය කොරියන් සමාගමක් වූ කාබුල් ලංකා සමාගමට විකුණූ බවත්;

(iii) කාබුල් ලංකා සමාගම විසින් එය වාස් ගෝල්ඩන් ආයතනයට පවරන විට සේවකයන්ට පාරිතෝෂික දීමනා හා වන්දි ගෙවූ බවත්;

(iv) මේ සෑම අවස්ථාවකම ආයතනය විකුණා ඇත්තේ සේවකයන් සහ ඔවුන්ගේ අයිතීන්ද ඇතුළත්ව බවත්;

(v) ඒ වනවිට නිල නිවාසවල පදිංචිව සිටි සේවකයන්ට, කිසිදු මුදලක් නොගෙවූ බවත්;

(vi) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මේ වනවිට මෙම නිවාසවල පදිංචි පුද්ගලයන් ඉවත් කිරීමට උත්සාහ කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සේවයෙන් විශ්‍රාම යනවිට හෝ සේවයෙන් ඉවත් කරන විට මෙම සේවකයන්ට ගෙවා නොමැති පාරිතෝෂික මුදල හා වන්දි මුදල් ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) නිල නිවාසවල වසර 40ක පමණ කාලයක් පදිංචිව සිටින පුද්ගලයන් එම නිවාසවලින් ඉවත් කිරීමේ උත්සාහය වළක්වා නිවාසවල හිමිකම ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

132/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මධ්‍යම අධිවේගී මාර්ගයේ, කුරුණෑගල සිට ගලගෙදර දක්වා ඉදිවෙන කොටසේ,

(i) සමස්ත දුර ප්‍රමාණය;

(ii) ඇස්තමේන්තුගත මුළු වියදම;

(iii) පිවිසුම් හා පිටවීමේ දොරටු ස්ථාපනය වන ස්ථාන;

(iv) ඉදිකිරීම් ආරම්භ කිරීමට හා අවසන් කිරීමට නියමිත දින;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අධිවේගී මාර්ගයේ ඉහත කොටස සඳහා මේ දක්වා,

(i) පවරා ගත් ඉඩම් ප්‍රමාණය;

(ii) ගෙවා ඇති මුළු වන්දි මුදල;

(iii) ගෙවීමට ඇති වන්දි මුදල් ප්‍රමාණය;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

138/2020

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි 08 සිට මේ දක්වා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් ඉදිකළ උදාගම් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් උදාගමෙහි ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) නිවාස ඉදිකිරීම සඳහා ණය හෝ ආධාර වශයෙන් රජය මඟින් ලබා දී ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ගම්මානවල යටිතල පහසුකම් සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) එම නිවාස ව්‍යාපෘති විවෘත කිරීමේ උත්සව සඳහා වියදම් කළ මුළු මුදල කොපමණද;

(iii) ඒ අතරින් ප්‍රචාරක වියදම් කොපමණද;

(iv) ඉදිරි වර්ෂයන් සඳහා ඉදිකිරීමට සැලසුම් කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2020 මාර්තු 18 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

26/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ග්‍රාම නිලධාරින් සඳහා සේවා ව්‍යවස්ථාවක් සකස් කළ යුතු බවත්;

(ii) ග්‍රාම නිලධාරින්ගේ දීමනා නැවත සලකා බලා සාධාරණයක් ඉටු කළයුතු බවත්;

(iii) ග්‍රාම නිලධාරි සේවයේ හා වෘත්තීය තුළ පවතින ගැටලු පිළිබඳව අවධානය යොමු කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ග්‍රාම නිලධාරි සේවයේ ඵලදායීත්වය ඉහළ නැංවීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

49/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 වර්ෂයේ ඌව පළාතෙන් උසස් පෙළ විභාගය උසස් ලෙස සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශිෂ්‍යයන්ගේ නම් කවරේද;

(iii) එම ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහනක් ඌව පළාත් සභාව ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, ශිෂ්‍යත්ව ලබාදුන් ශිෂ්‍යයන්ගේ නම් හා එම ශිෂ්‍යත්වවල මූල්‍යමය වටිනාකම ආදී විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

79/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයින පුරා මේ වනවිට පවත්වාගෙන යනු ලබන සිනමාශාලා කවරේද;

(ii) ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) එම සිනමාශාලාවල හිමිකරුවන් සහ ඒවා ආරම්භ කර ඇති දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා පිහිටි සිනමාශාලා වර්ගීකරණයක් කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයටද;

(iii) එම සිනමාශාලා නියාමනය කරනු ලබන්නේ කවුරුන්ද;

(iv) ඉතා අඩු පහසුකම් සහිතව හා දුර්වල ක්‍රියාකාරිත්වයෙන් යුතුව පවත්වාගෙන යනු ලබන සිනමාශාලා තිබෙන බව දන්නේද;

(v) එසේ නම්, සිනමාශාලා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා, සිනමාශාලා නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් කඩිනමින් සකස් කරන්නේද;

(vi) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

103/2020

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2014 වර්ෂයේදී බදුල්ල දිස්ත්‍රික්කයේ, මීරියබැද්ද නායයෑමෙන්,

(i) මියගිය සංඛ්‍යාව කොපමණද;

(ii) ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

(iii) විපතට පත් පුද්ගලයන්ට රජය විසින් ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් රජය විසින් ගෙවන ලද වන්දි මුදල කොපමණද;

(v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවන ලද උපරිම සහ අවම වන්දි මුදල කොපමණද;

(vi) අවතැන් වූ සියලුම දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;

(vii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

109/2020

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013, 2014, 2015, 2016, 2017, 2018 සහ 2019 වර්ෂවලදී ජනාධිපතිවරයා විසින් සිදුකළ විදෙස් සංචාර සහ එම සංචාරවල අරමුණු;

(ii) එම එක් එක් සංචාරය සඳහා සහභාගී වූ පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ තනතුරු;

(iii) එම එක් එක් සංචාරය සඳහා වියදම් කළ මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

146/2020

ගරු බිමල් රත්නායක මහතා,— කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් රු.500.00ක විභාග ගාස්තුවක් අයකරමින් පුරප්පාඩු 3771ක් පිරවීම සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් (iii ශ්‍රේණිය) බඳවා ගැනීම සඳහා විභාගයක් පැවැත්වූ බවත්;

(ii) එම විභාගය සඳහා 75,000කට අධික අයදුම්කරුවන් පිරිසක් පෙනී සිටි බවත්;

(iii) ඉන් සමත් වූ 1904 දෙනෙකුට 2017 වර්ෂයේදී පත්වීම් ලබාදුන් බවත්;

(iv) ඉතිරි පිරිසට 2018 වර්ෂයේදී පත්වීම් ලබාදෙන බවට පොරොන්දු වූ බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) එම විභාගයෙන් සමත්වූවන් අතරින් ඉතිරි පුරප්පාඩු 1867 සඳහා බඳවා ගැනීම් සිදු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

156/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ පිහිටි,

(i) වන රක්ෂිතයන්හි ඝනත්වය;

(ii) රක්ෂිතයන්හි පිහිටි වැව් සංඛ්‍යාව;

(iii) වැසි වනාන්තර හා ඒවායෙහි ඝනත්වය;

වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඔබ අමාත්‍යාංශය මඟින් 2017 වර්ෂය තුළ,

(i) පරිසර සංරක්ෂණය වෙනුවෙන් දියත් කළ වැඩසටහන් කවරේද;

(ii) ඒ වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) පරිසර හිතකාමී ව්‍යාපාර ඇගයීම සඳහා සිදුකළ වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) බොහෝ නගරයන් ඔස්සේ ගලන අපවිත්‍ර ජලය ගංගාවලට එක්වීමෙන් විශාල වශයෙන් ජල දූෂණය සිදු වන බැවින්, මෙලෙස අපවිත්‍ර ජලය ඍජුවම ගංගාවලට මුසුවීම වැළැක්වීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

27/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය මඟින් පුහුණුව ලැබූ අභ්‍යාසලාභී ඉංජිනේරු සහකාර දෙවැනි කණ්ඩායමේ 71 දෙනෙකු මේ වනතෙක් ස්ථිර සේවයට බඳවාගෙන නොමැති බවත්;

(ii) දැනට පුහුණුව අවසන් වී වසරක් ඉක්ම ගොස් ඇති බවත්;

(iii) ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්තව සේවය කළද නිසි වැටුප් ගෙවීමක් සිදු නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිස ස්ථිර සේවයට අනුයුක්ත කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

53/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ඌව පළාත් සභාවේ මහජන නියෝජිතයන් හා මාණ්ඩලික නිලධාරීන් සිදු කළ විදේශ අධ්‍යයන චාරිකා සම්බන්ධයෙන් 2015 වර්ෂයේදී විගණන විමසුමක් ඉදිරිපත් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම විගණන විමසුමට අනුව,

(i) මහජන නියෝජිතයන් සහභාගි වී ඇති පාඨමාලා කවරේද;

(ii) සහභාගි වී ඇති මහජන නියෝජිතයන් හා නිලධාරීන්ගේ නම් කවරේද;

(iii) වැය කර ඇති මුදල කොපමණද;

(iv) නිලධාරීන් තෝරා ගැනීමේදී අනුගමනය කර ඇති ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

106/2020

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015.09.01 දින සිට 2018.12.31 දින දක්වා ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා, කථානායකවරයා සහ අමාත්‍යවරයන් සමඟ යෙදුනු විදේශ සංචාර ද ඇතුළුව එක් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා යෙදුණු නිල විදේශ සංචාර සංඛ්‍යාව, අවරෝහණ පිළිවෙළට එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

110/2020

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015.01.09 දින සිට 2019.12.31 දින දක්වා අග්‍රාමාත්‍යවරයා විසින් සිදුකළ විදේශ සංචාර;

(ii) එම සංචාරවල අරමුණු;

(iii) එම එක් එක් සංචාරය සඳහා සහභාගි වූ පුද්ගලයන් සංඛ්‍යාව හා ඔවුන්ගේ තනතුරු;

(iv) එම එක් එක් සංචාරය සඳහා වියදම් කළ මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

163/2020

ගරු හේෂා විතානගේ මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ හදබිම අධිකාරිය නමින් ආයතනයක් තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයේ ප්‍රධාන කාර්යයන් කවරේද;

(iii) දැනට එම කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ නම හා ලිපිනය කවරේද;

(iv) මෙම ගොඩනැගිල්ලට මාසිකව හා වාර්ෂිකව ගෙවනු ලබන කුළිය කවරේද;

(v) මෙම ආයතනය කෘෂිකර්ම අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේම ස්ථාපිත කිරීමට අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

171/2020

ගරු බිමල් රත්නායක මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහබැංකු බැඳුම්කර වංචා සඳහා චෝදනා එල්ල වී ඇති අර්ජුන් මහේන්ද්‍රන් මහතාට එරෙහිව විවිධ අධිකරණවල පවරා ඇති නඩු කවරේද;

(ii) එම නඩු අංක හා ඒවායේ සඳහන් චෝදනා නිශ්චිත වශයෙන් සඳහන් කරන්නේද;

(iii) අර්ජුන් මහේන්ද්‍රන් මහතා අත්අඩංගුවට ගැනීම සඳහා දැනට ගෙන ඇති පියවර කවරේද;

(iv) ඔහු දැනට සිංගප්පූරුවේ ජීවත්වන හා සිංගප්පූරු ජාතිකයෙක් බව සඳහන් වන බැවින්, ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා සිංගප්පූරු ආණ්ඩුව සමඟ සිදුකර ඇති කටයුතුවල ප්‍රගතිය කවරේද;

(v) අධිකරණ වරෙන්තු මත සිටින ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා ආරක්ෂක කණ්ඩායම් සිංගප්පූරුවට හෝ වෙනත් රටකට ගොස් තිබේද;

(vi) එසේ නම්, එම රටවල් සහ දින කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

179/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ, ඉඩම් අමාත්‍යාංශය හා ප්‍රාදේශීය ලේකම් සතුව පැවති ඉඩම් ප්‍රමාණය, එක් එක් ග්‍රාමසේවා වසම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලසීමාව ඇතුළත මහජනතාවට එම ප්‍රදේශයෙන් ලබාදුන් ඉඩම් ප්‍රමාණය හා ලබාදුන් ස්ථාන කවරේද;

(iii) ඉඩම් ලබාදුන් පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ලබාදුන් පදනම කවරේද;

(iv) නායයෑම් හා ගල්වලවල් කැපීම හේතුවෙන් හානි සිදුවන මෙම ප්‍රදේශයේ අවදානම් කලාපය තුළ ජීවත්වන ජනතාවට මෙතෙක් ඉඩම් ලැබී නොමැති බව පිළිගන්නේද;

(v) එම අවදානම් කලාපය තුළ ජීවත්වන්නන්ට සුදුසු ඉඩම් එම ප්‍රදේශයෙන්ම ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2020 මාර්තු 19 වැනි බ්‍රහස්පතින්දා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

28/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අ.පො.ස. (උසස් පෙළ) ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ටැබ් (Tab) පරිගණක ලබා දීම සඳහා අයවැයෙන් මුදල් වෙන් කරන ලද වර්ෂය කවරේද;

(ii) ඒ සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) මේ සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතන කවරේද;

(v) ඒ අතරින් තෝරාගත් ආයතනයේ නම කවරේද;

(vi) ටෙන්ඩර් කැඳවීමේ දී ඉදිරිපත් කළ පිරිවිතර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත පිරිසට Tab පරිගණක ලබා දීම සඳහා මිලදී ගැනීම් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ලංකාවේ සියලුම අ.පො.ස. (උසස් පෙළ) පන්ති සඳහා ඉගැන්වීම් සිදු කරන ගුරුවරුන්ට සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට Tab පරිගණක ලබා දීමට බලාපොරොත්තු වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

50/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභා පාසල්වල සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරුවරු අතරින් බොහෝ පිරිසකට හිඟ වැටුප් ගෙවීමට ඇතිබව දන්නේද;

(iii) එම ගුරුවරුන්ට හිමි හිඟ වැටුප් ගෙවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

113/2020

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඇස්බැස්ටෝස් භාවිතය තහනම් කිරීමට රජය තීරණය කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා බල පෑ හේතු කවරේද;

(iii) එම තහනම සඳහා රජය විසින් පදනම් කරගත් විද්වත් කමිටු හෝ විශේෂඥ වාර්තා කවරේද;

(iv) එම තහනම ඉවත් කිරීම සඳහා රජය තීන්දු කළ දිනය කවරේද;

(v) ඒ සඳහා බල පෑ හේතු කවරේද;

(vi) යළිත් ඇස්බැස්ටෝස් භාවිතය සුදුසු බව නිර්දේශ කළ විද්වතුන් හෝ විශේෂඥයන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

164/2020

ගරු හේෂා විතානගේ මහතා,— පරිසර සහ වනජීවි සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උඩවලව ඇත් අතුරු සෙවනේ දැනට සිටින අලි ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම අලි ඇතුන් වෙනත් ස්ථානයන්ට මාරු කිරීමක් හෝ වනයට මුදාහැරීමක් සිදුකරන්නේ නම්, ඒ කෙසේද;

(iii) වර්ෂ 2005 - 2015 කාලසීමාව තුළ මෙහි සිටි ඇත් පැටවුන් මුදා හැර ඇති ආකාරය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

172/2020

ගරු බිමල් රත්නායක මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති එක් එක් දෙපාර්තමේන්තුවේ ආරක්ෂක වියදමෙන් ඒ ඒ දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරින්ට හා සෙසු නිලයන්ට වැටුප් හා දීමනා ගෙවීමට දරන ලද වියදම හා එය සමස්ත වියදමේ ප්‍රතිශතයක් ලෙස දක්වන්නේද;

(ii) 1948න් පසු ශ්‍රී ලංකා ආණ්ඩුව, එක්සත් ජනපදය ඇතුළුව ආරක්ෂක ගිවිසුම්වලට එළඹ ඇති රටවල් කවරේද;

(iii) එම ආරක්ෂක ගිවිසුම් අත්සන් කළ රට, දිනය, එම ආරක්ෂක ගිවිසුමේ නාමය හා අරමුණු සහ ගිවිසුම අවසන් වන දිනය සඳහන් කරන්නේද;

(iv) අත්සන් කරන ලද ආරක්ෂක ගිවිසුම්වලින් දැනට වලංගුව පවතින ආරක්ෂක ගිවිසුම් කවරේද;

(v) එම සියලුම ආරක්ෂක ගිවිසුම්වල පිටපත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

180/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීමට වැය කළ මුදල කොපමණද;

(ii) ඒ සඳහා මුදල් ලබාගත් මූලාශ්‍ර කවරේද;

(iii) මේ දක්වා එහි පැවති ක්‍රිකට් තරඟ සංඛ්‍යාව හා පැවති තරඟ වර්ග කවරේද;

(iv) මේ දක්වා එම ක්‍රීඩාංගණය තුළින් ඉපයූ ආදායම හා නඩත්තු වියදම් කවරේද;

(v) මෙම ක්‍රීඩාංගණය දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

29/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුතුරාජවෙල අභය භූමිය ශ්‍රී ලංකාවේ විශාලතම වගුරු බිම බවත්;

(ii) විවිධ සංවර්ධන කටයුතු හේතුවෙන් මෙම භූමිය විනාශ වෙමින් පවතින බවත්;

(iii) මෙම භූමියෙන් අක්කර 406ක් නිවාස ව්‍යාපෘතියක් සඳහා මැල්වත්ත ප්‍රොපටි ඩිවලොපර්ස් නමැති සමාගමකට ලබාදී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත ව්‍යාපෘතිය සඳහා පර්චසයක් ලබා දී ඇති මිල කොපමණද;

(ii) මෙම ගනුදෙනුව නීති විරෝධී බව පිළිගන්නේද;

(iii) එසේ නම්, මෙම ව්‍යාපෘතියට එරෙහිව පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

55/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග කිලෝමීටර් ප්‍රමාණය, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ශ්‍රේණිගත කිරීම්වලට අනුව එම ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2013 සිට 2017 දක්වා කාපට් අතුරන ලද ඌව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් බදුල්ල දිස්ත්‍රික්කයේ මාර්ග කිලෝමීටර් ප්‍රමාණය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඌව පළාත් සභාවට අයත් මාර්ග සංවර්ධනය කිරීමට හා නඩත්තු කිරීමට මූල්‍ය ප්‍රතිපාදන සපයනු ලබන ප්‍රභවයන් කවරේද;

(v) වර්ෂ 2013 සිට 2016 දක්වා ඉහත (iv) හි සඳහන් ප්‍රභවයන් යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් මාර්ග සංවර්ධනය කිරීම සඳහා වැයකරනු ලැබූ මුදල් ප්‍රමාණය, එක් එක් වර්ෂය සහ ප්‍රභවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

165/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2015 දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කරන ලද උදා ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එමඟින් නිවාස හිමි වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය රජය විසින් ආරම්භ කර තිබූ උදා ගම්මාන සංඛ්‍යාව කවරේද;

(iv) එමඟින් සහන සලසා ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(v) රටේ ඉදිරි නිවාස අවශ්‍යතාවය වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

173/2020

ගරු බිමල් රත්නායක මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2010 සිට 2019 දක්වා විවිධ චෝදනා මත,

(i) ශ්‍රී ලංකා යුද හමුදා පනතේ විධිවිධාන අනුව හමුදා අධිකරණ මඟින් දඬුවම් ලබාදුන් නිලධාරීන් සහ සෙබළුන් සංඛ්‍යාව;

(ii) ශ්‍රී ලංකා ගුවන් හමුදා පනත අනුව එහි අධිකරණය මඟින් දඬුවම් ලබාදුන් නිලධාරීන් සහ සෙබළුන් සංඛ්‍යාව;

(iii) ශ්‍රී ලංකා නාවික හමුදා පනත අනුව එහි අධිකරණය මඟින් දඬුවම් ලබාදුන් නිලධාරීන් සහ සෙබළුන් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2010 සිට 2019 දක්වා,

(i) ශ්‍රී ලංකාවේ ආරක්ෂක කටයුතු සඳහා අයවැයෙන් වෙන් කළ ප්‍රතිපාදනය සහ භාවිතා කළ මුදල;

(ii) ඉහත (i) හි සඳහන් ප්‍රතිපාදනවලින් ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති එක් එක් දෙපාර්තමේන්තු සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

181/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්තල ගුවන්තොටුපොළ ඉදිකිරීම සඳහා වැය කරනු ලැබූ මුදල කොපමණද;

(ii) එම මුදල් සපයා ගත් මූලාශ්‍ර කවරේද;

(iii) එම ගුවන්තොටුපොළ විවෘත කළ දින සිට මේ දක්වා ලැබූ ආදායම හා නඩත්තු කටයුතු වෙනුවෙන් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම ගුවන්තොටුපොළ විවෘත කළ දිනයේ සිට මෙතෙක් එහි පැමිණි ගුවන් යානා සංඛ්‍යාව සහ ගුවන් සේවා ආයතනවල නම් කවරේද;

(v) එම කාලසීමාව තුළ මත්තල ගුවන්තොටුපොළ හරහා ගමන්ගත් මගීන් සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) මත්තල ගුවන්තොටුපොළ දියුණු කිරීම සම්බන්ධයෙන් රජයේ දැක්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2020 මාර්තු 20 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

39/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015, 2016 හා 2017හිදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදුකරන ලද වෙළෙඳපොළ වැටලීම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අය කරගත් දඩ මුදල් ප්‍රමාණය එම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වැටලීම් සිදුකිරීමෙන් වරදකරුවන් වන වෙළෙඳ ආයතන හා පුද්ගලයන් සම්බන්ධ පසු විපරම් කිරීමේ ක්‍රියාවලියක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සතුව පවතීද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වංචනික වෙළෙඳ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ට පැමිණිලි කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

159/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, වැවිලි සමාගම් ආශ්‍රිතව සේවය කරන සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල මන්ද පෝෂණය ඉහළ මට්ටමක පවතින බව දන්නේද;

(ii) පසුගිය රජය විසින් ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා ලබාදෙන "පෝෂණ මල්ල" වැඩසටහනට සමගාමීව, වතු වැවිලි සමාගම් හරහාද එම ජනතාවට පෝෂණ මල්ලක් ලබාදීම සුදුසු බව පිළිගන්නේද;

(iii) එසේ නම්, වතු වැවිලි සමාගම් හරහා එවැනි වැඩසටහනක් දියත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

166/2020

ගරු හේෂා විතානගේ මහතා,— ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණය සඳහා ඡන්ද ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලැබූ ක්‍රිකට් ක්‍රීඩා සමාජ හා දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් ක්‍රීඩා සංගම්වල නම් හා ලිපිනයන් හා ඔවුන්ට හිමි ඡන්ද සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පසුගිය රජය බලයට පත්වීමෙන් පසුව එක් එක් ක්‍රීඩා සංගමයට ලබා දුන් මූල්‍යමය හා වෙනත් ආධාර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය එම සංගම්වලට මූල්‍ය හා වෙනත් ආධාර ලබා දීමේ කටයුත්ත විධිමත්ව සිදු වන්නේද යන්න සොයා බැලීම සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

174/2020

ගරු බිමල් රත්නායක මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විවිධ චෝදනා මත මේ වනවිට රිමාන්ඩ් භාරයේ හෝ සිරගතව සිටින බුද්ධි අංශ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සිරගත කිරීමට හෝ රිමාන්ඩ් ගත කිරීමට ලක්කළ දින කවරේද;

(iii) ඔවුන්ට විරුද්ධව ඇති චෝදනා හා නඩු අංක වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම බුද්ධි අංශ නිලධාරීන් පිළිබඳව අදාළ හමුදා පනත් හා පොලිස් ආඥා පනත පරීක්ෂා කර දඬුවම් ලබා දී තිබේද;

(v) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

182/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා වැය කරනු ලැබූ මුදල කොපමණද;

(ii) එම මුදල් සපයා ගත් මූලාශ්‍ර කවරේද;

(iii) වරාය විවෘත කළ දිනයේ සිට මේ දක්වා එම වරායට පැමිණි නැව් සංඛ්‍යාව, එම නැව්වල නම් සහ ගොඩබාන ලද බහාලුම් සංඛ්‍යාව, මාසිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම කාලසීමාව තුළ වරායේ ආදායම සහ නඩත්තු වියදම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) හම්බන්තොට වරාය, කලාපයේ දියුණු වරායක් බවට පත් කිරීම සම්බන්ධයෙන් රජයේ වැඩපිළිවෙල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

40/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම විසින් මිනිරන් නිෂ්පාදන අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් කවරේද;

(ii) උක්ත රාජ්‍යයන්ට අමතරව, නව ගැනුම්කරුවන් හා ගිවිසුම්ගතවීමට පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම රටවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2015, 2016 හා 2017 වර්ෂවල මිනිරන් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වාර්ෂිකව නිෂ්පාදනය වැඩි කිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, ඒ කවර ප්‍රමාණයකින්ද;

(iv) මෙම පතලේ ඇති මිනිරන් ප්‍රමාණය පිළිබඳව පරීක්ෂා කර තිබේද;

(v) එසේ නම්, පතලේ තවදුරටත් කැනීම් කළ හැකි මිනිරන් මෙට්‍රික් ටොන් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

160/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 අප්‍රේල් 09 දිනැති අංක අපෙ/15/0180/6/3/008 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක් අමාත්‍යවරයකු සඳහා පත් කළ හැකි උපදේශකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ වුවද, හිටපු ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් හිටපු ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සඳහා උපදේශකයන් 07 දෙනෙකු පත්කර තිබූ බව දන්නේද;

(iii) උපදේශකයන් පත්කිරීම සම්බන්ධයෙන් පැහැදිලි අමාත්‍ය මණ්ඩල තීරණයක් තිබියදී, එය නොසලකා හිටපු ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සඳහා උපදේශකයන් 07 දෙනෙකු පත්කර ගනු ලැබුයේ කවර නීතිමය ප්‍රතිපාදනයක් මතද;

(iv) මේ සම්බන්ධයෙන් විගණන විමසුමේ දක්වා ඇති කරුණු අනුව නිවැරදි කිරීම් සිදු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

167/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය නිසා උග්‍ර පානීය ජල හිඟයකට මුහුණ පා සිටින,

(i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iii) පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් උග්‍ර පානීය ජල හිඟයකට මුහුණ පා සිටින ජනතාවගේ ජල අවශ්‍යතා විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

175/2020

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට ඇති රජයට අයත් හා රජයට අයත් නොවන පෞද්ගලික උපාධි ප්‍රදානය කිරීමේ බලතල සහිත ආයතනවල නම්, ලිපින සහ ඒවායේ පීඨවල හා දෙපාර්තමේන්තුවල නම් හා දෙපාර්තමේන්තු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ආයතනයට උපාධි ප්‍රදානය කිරීමේ බලතල ලබාදීමට තීන්දු කළ කමිටු සාමාජිකයන්ගේ නම් හා අදාළ දිනයන් කවරේද;

(iii) මීට අමතරව, උපාධි ප්‍රදානය කිරීමේ බලය සහිත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ප්‍රමිති පරීක්ෂාව සිදු නොකළ උපාධි ප්‍රදානය කිරීමේ ආයතන කවරේද;

(iv) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමතියකින් තොරව ඉහත (iii) හි සඳහන් ආයතනවලට උපාධි ප්‍රදානය කිරීමේ බලය ලැබී ඇත්තේ ශ්‍රී ලංකාවේ පවතින කුමන නීතිමය පදනමක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

183/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුම්රිය කෞතුකාගාරය ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම මුදල් සපයා ගත් මූලාශ්‍ර කවරේද;

(iv) එම කෞතුකාගාරය රජයේ මුදල් වැය කර ස්ථාපිත කිරීමෙන් පසුව එය පවත්වාගෙන යෑම පෞද්ගලික සමාගමකට පැවරීමට කටයුතු කර තිබේද;

(v) බදුල්ල සහ කඩුගන්නාවේ පිහිටි සෙසු කෞතුකාගාර වැඩිදියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?